**අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව - 2023**
**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයක් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ ණය මුදල වෙනුවෙන් ගෙවිය යුතු වාරික සහ පොළිය රු.342,246 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන් වෙනුවෙන් හිඟ වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ලද රු.536,834 ක් සමුච්චිත අරමුදලට බැර නොකර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, වර්ෂය තුළදී වැඩිපුර ලද රු.10,289 ක් වගකීමක් ලෙස ගිණුම්ගත නොකර ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කළයුතු රු.991,400 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දැක්වුණි. | පුනරාවර්ථන වැය විෂයයන්හි සටහන් කර සිදු වූ වරද නිවැරදි කරන බව | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් පසුව අයකර ගැනීමේ ණය පදනම මත ලබාදී තිබූ රු.1,000,000 ක් වගකීමක් ලෙස ගිණුම්ගත නොකර ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි ආදායම් ශීර්ෂයට ඇතුළත් කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයන් සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ගෙවීම් කරනු නොලබන රු.390,030 ක උසාවි දඩ මුදල් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ නඩු පැවරීම් වටිනාකම සම්පූර්ණයෙන්ම අයකර ගෙන තිබුණත්, රු.71,830 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 10 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.3,329,612 ක වෙනසක් විය. | වෙනස ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු.2,699,144 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කරන බව සහ ඇතැම් ශේෂ පිළිබඳ විස්තර සොයා ගත නොහැකි බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | 2013 වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ වසම් 04 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර වසර 10 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් තක්සේරු කටයුතු සිදුකරමින් පවතින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | කල් ඉකුත් වූ 2004 හා 2019 වර්ෂයත් අතර වූ රු.254,150 ක ටෙන්ඩර් ඇප තැන්පත් ශේෂ 28 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | තැන්පත් ශේෂවල වෙනස්කම් පවතින නිසා නියාදනය කිරීම ගැටළු සහගත බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 22 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට කරනු ලැබූ සංශෝධන | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ඒකක 22 ක් එසේ නොකිරීම නිසා රු.108,900 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගන්නා ලෙස ලිපි මඟින් දැනුවත් කළ බව | පාරිසරික පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | මියගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.252,083 ක උත්සව හා ආපදා ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,210,453 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,421,128 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 852,000 | 1,366,805 | 1,391,075 | 6,760 | 802,000 | 747,070 | 781,430 | 31,030 |
| කුලී | 20,846,320 | 13,104,557 | 13,039,449 | 296,022 | 13,966,850 | 13,401,004 | 13,654,221 | 230,914 |
| බලපත්‍ර ගාස්තු | 3,258,020 | 3,605,561 | 3,705,442 | 26,000 | 2,499,480 | 3,088,621 | 3,224,565 | 125,881 |
| වෙනත් ආදායම් | 23,503,170 | 4,564,766 | 8,610,376 | 71,830 | 143,796,662 | 46,610,639 | 45,279,519 | 4,117,440 |
| එකතුව | 48,459,510 | 22,641,689 | 26,746,342 | 400,612 | 161,064,92 | 63,847,334 | 62,939,735 | 4,505,265 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු මාළු කඩය බදු දීම වෙනුවෙන් රු.197,197 ක කුලී ආදායමක් හා පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස පිළිවෙලින් රු.2,251,757 ක් හා රු.3,758,064 ක් ලැබිය යුතුව පැවතුණි. | කඩ කුලිය සඳහා නඩු පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව හා ලැබිය යුතු හිඟ උසාවි දඩ මුදලින් රු.383,000 ක් අයවී ඇති අතර ඉකුත් වර්ෂයන්ට අදාළ හිඟ උසාවි දඩ නිරවුල් කිරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට අක්‍රියව පවතින ලංකා බෙල් දුරකථන සම්බන්ධතා 05 ක් විසන්ධි කිරීමට කටයුතු නොකිරීම නිසා එහි ස්ථාවර ගාස්තු ලෙස මසකට රු.500 බැගින් ගෙවීම් කිරීමෙන් සභා අරමුදලට වූ පාඩුව රු.102,500 ක් වූ අතර එය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි හානි හා පාඩු හඳුනාගත් වහාම නිවැරදි කිරීමට කටයුතු කරන බව | සභා අරමුදලට සිදුව ඇති පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් අනුමත කර තිබූ ගොඩනැගිලි සැලසුම් 03 කට අදාළව ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු, පෙරසැරි ගාස්තු, අනුකූලතා සහතික ගාස්තු ලෙස එකතුව රු.1,199,428 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. අනුකූලතා සහතික ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යා නොහැකි වුවත්, ගොඩනැගිලි තුනෙහි ඉදිකිරීම් කටයුතු නිමකර ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන නිසා ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත ගාස්තු සභාවට ගෙවන ලෙසට අදාළ පාර්ශවයන්ට ලිපි මඟින් දැනුවත් කළ බව | නියමිත ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතයට ගනු ලබන ඉඩම් 142 ක නීත්‍යානුකූල අයිතිය සහ ලද දිනය ද නිශ්චිතව සඳහන්ව නොමැති වාහන හා යන්ත්‍රෝපකරණ 04 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග සංවර්ධන ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික අයවැය මගින් රු. මිලියන 35 ක් වෙන්කර තිබුණද එම කටයුතු නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි. | අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන නොලැබීම මත ක්‍රියාත්මක කළ නොහැකි වූ බව. | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ලේඛනය මගින් වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබූ කාර්යයන් ක්‍රියාත්මක නොකර එම ප්‍රතිපාදන වලින් රු.1,433,077 ක් වැයකර වෙනත් කාර්යයන් ඉටු කර තිබුණි. | ඉදිරියේදී අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කළ කාර්යයන් නිවැරදිව හඳුනාගෙන වැයකිරීම් සිදුකරන බව | අයවැය මගින් වෙන්කළ ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා යෙදවිය යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 68 ක් හා 80 ක් වූයෙන් අතිරික්තතා 16 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අතිරික්ත තනතුරු විධිමත් කිරීමට කටයුතු කරන බව | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 05 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවෙකු වෙත තනතුරට හිමි අනුමත රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරී පවරා තිබූ අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,058,173 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි. | සේවා අවශ්‍යතාවය මත රාජකාරි පැවරීමට කටයුතු කළ බව. | සේවකයින් අනුමත රාජකාරීවල යෙදවිය යුතුය. |